අංක : 2006 / 101




ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

ෆැක්ස්. / தொலைநகல் / Fax } 2684051

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ඊමේල් / ஈ - மெயில் / E-mail } Landcom@sltnet.lk


මගේ අංකය / எனது இல / MY NO } 4 / 1 / වවධ / සුනාමි දීමනාපත්‍ර    ඔබේ අංකය / உமது இல / YOUR NO }    දිනය / திகதி / DATE } 2006.02.28

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

## <u>සුනාමියෙන් හානිවූ නිවාස නැවත ඉදිකිරීම හා ඉඩම් වලට දීමනාපත්‍ර ලබාදීම.</u>

සුනාමි ව්‍යසනයට ලක්වූ ඉඩම් වල හිමිකරුවන් සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍රයක් මත විකල්ප ඉඩම් ලබා දීමට රජය විසින් තීරණය කර ඇත. ඊට අදාලව දැනටමත් ප්‍රධාන විධායක නිලධාරී, සුනාමියෙන් හානිවූ නිවාස නැවත ඉදිකිරීමේ ඒකකය, නාගරික සංවර්ධන හා ජලසම්පාදන අමාත්‍යාංශය විසින් ඔබ වෙත එවා ඇති ඔහුගේ අංක : ඉඩම් / අන් / දීමනාපත්‍ර හා 2005.09.29 දිනැති ලිපියෙහි අවසාන ඡේදය කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරවමි.

මෙම දීමනාපත්‍රය ලබාදීම සඳහා සුදුසුකම් ලබන පුද්ගලයන් පිළිබඳ පරීක්ෂණ පවත්වා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමෙන් පසුව එම නම් ලැයිස්තු, ඒ ඒ පුද්ගලයාට ලබා දෙන ඉඩම් සම්බන්ධව විස්තරය ද සමග ඔබේ නිර්දේශ අදාළ පළාත් ඉඩම් කොමසාරිස් හෝ මෙම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස් මගින් මා වෙත එවන්න.

හානියට පත් ඉඩම් හා නිවසේ හිමිකම භාර්යාව නමින් තිබෙන අවස්ථා වලදී අදාළ නිර්දේශ ඇය නමින් ඉදිරිපත් කරන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි.

ඉහත ලැයිස්තු එවන විට පහත සඳහන් ආකෘතිය පරිදි එම විස්තර එවන්නේ නම් මැනවි.

| අනු අංක | සම්පූර්ණ නම | ලිපිනය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | ඉඩමේ නම | පිඹුරු අංකය | කට්ටි අංකය | කට්ටියේ ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

මෙම වාර්තා මා වෙත ලැබුණු පසුව එම ඉඩම් බැහැර කිරීම සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 20 රෙගුලාසිය යටතේ වන අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට මා විසින් කටයුතු කරනු ලැබේ.

මේ විස්තර එවන අතරම ඉඩම් මැන ගල් දමා "O" රේඛා චිත්‍ර ලබාගැනීම සඳහා රේඛා චිත්‍ර ඉල්ලුම් පත්‍ර යැවීම ද සුදුසුය.

(අත්සන)

ආර්. ගුණරත්න
ඉඩම් කොමසාරිස් ජනරාල් (වැ. බ.)

පිටපත් :-
1. ජනාධිපති ලේකම්
2. කෘෂිකර්ම සංවර්ධන ලේකම්
3. මිනුම්පති
4. ප්‍රධාන විධායක නිලධාරී සුනාමි මණ්ඩලය
5. සියළුම දිසා ලේකම්වරු
6. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
7. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන්